# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2116/47 - 2019 මාර්තු මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2019.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 15/2014 (II)

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 53(2) සහ 54(1)(අ) වගන්ති සමග කියවිය යුතු, එකී පනතේ 58 වන වගන්තිය යටතේ නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**සජිත් ප්‍රේමදාස,**
නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2019 මාර්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2019 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (අභියාචනා කාර්ය පටිපාටිය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද (මෙහි මින් මතු ''අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් දෙන ලද යම් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් එකී තීරණයට එරෙහිව පනතේ 53 වන වගන්තියේ විධිවිධාන යටතේ පිහිටුවන ලද අභියාචනා මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපනියෝගය යටතේ වන සෑම අභියාචනයක්ම ලිඛිතව සහ මෙහි පළමුවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියෙහි සාරානුකූලව සිදු කරනු ලැබිය යුතු අතර, මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුව සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

3. 2 වන නියෝගයේ (1) වන උපනියෝගය යටතේ වන සෑම අභියාචනයක් ම පහත දැක්වෙන ලේඛන සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය :-

*(අ)* අධිකාරියේ තීරණයේ සහතික කරන ලද පිටපතක්;

*(ආ)* (i) අභියාචකගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපතක්; හෝ

(ii) සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් හෝ තනි හිමිකරුවකු ලෙස ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි සහතික කරන ලද පිටපතක්;

*(ඇ)* (ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු සම්බන්ධයෙන් වන අවස්ථාවක දී) ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු ලෙස අධිකාරියෙහි ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කරන ලද පිටපතක්;

*(ඈ)* ඉදිකිරීම් කර්මාන්තයේ වෙනත් යම් පරදු දරන්නකු ලෙස අධිකාරියෙහි ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කරන ලද පිටපතක්;

*(ඉ)* අභියාචනයේ දී සාක්ෂි වශයෙන් භාවිත කරනු ලැබිය හැකි ලේඛන ලැයිස්තුවක් සහ එකී සියලු ලේඛනවල සහතික කරන ලද පිටපත්; සහ

*(ඊ)* අභියාචනය සඳහා ගාස්තු ගෙවීම ඔප්පු කිරීම සඳහා ලදුපතෙහි පිටපතක්.

4. අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන සෑම තැනැත්තකු විසින් ම, අධිකාරියේ තීරණය සම්බන්ධයෙන් අතෘප්තියට පත්වීම සඳහා හේතු සහ අපේක්ෂා කරනු ලබන සහනය නිවැරදිව සඳහන් කරමින් අභියාචනයට අමුණන ලද අභියාචක විසින් අත්සන් කරන ලද ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

5. අභියාචනයක් ඉදරිපත් කරනු ලබන සෑම තැනැත්තකු විසින් ම, අධිකාරියේ තීරණයේ දින සිට දින තිහක කාලසීමාවක් ඇතුළත එකී අභියාචනය පිටපත් තුනකින් අභියාචනා මණ්ඩලයේ ලේකම්වරයා වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු ය.

6. සෑම අභියාචනයක් ම, එය ලැබීමෙන් රාජකාරි දින හතක කාලසීමාවක් ඇතුළත අභියාචනා මණ්ඩලයේ ලේකම්වරයා විසින්, ලැබුණු බව ලිඛිතව දන්වා යැවිය යුතු ය.

## පළමුවන උපලේඛනය

### *අභියාචනා ආකෘතිය*

(2 (2) වන නියෝගය)

*අභියාචකගේ විස්තරඃ*

1. අභියාචක ස්වාභාවික පුද්ගලයෙක් ද නෛතික පුද්ගලයෙක් ද යන වග ..........................................................

ස්වාභාවික පුද්ගලයෙක් නම්ඃ

(i) සම්පූර්ණ නම ඃ...................................................................................................

(ii) ස්ථිර ලිපිනය ඃ....................................................................................................

(iii) දුරකථන අංකය (නිවස)ඃ.................................... (ජංගම)ඃ...............................

(iv) විද්‍යුත් තැපැල් ලිපිනය (ඇත්නම්)ඃ...................................................................

(v) ජාතික හැඳුනුම්පත් අංකය ඃ.................................................................................

*නෛතික පුද්ගලයෙක් නම්ඃ*

(i) සංවිධානයේ නම ඃ............................................................................................

(ii) නෛතික පුද්ගලභාවයේ ස්වභාවය (තනි හිමිකරුවෙක්/හවුල් ව්‍යාපාරයක්/සීමාසහිත සමාගමක්)ඃ ................................ ..........................................................................................

(iii) ලියාපදිංචි ලිපිනය ඃ.........................................................................................

(iv) ලියාපදිංචි කිරීමේ අංකයඃ .................................................................................

(v) දුරකථන අංකය ඃ..........................................................

2. අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ කුමන තත්ත්වයකින් ද (දේශීය කොන්ත්‍රාත්කරුවකු/විදේශීය කොන්ත්‍රාත්කරුවකු/දේපළ සංවර්ධනකරුවකු/ඉදිකිරීම් ද්‍රව්‍ය සපයන්නකු/බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ අයිතිකරුවකු/ශිල්පියකු/ඉදිකිරීම් වැඩකරුවකු/දේශීය උපදේශකයකු (සුදුසුකම්ලත් තැනැත්තකු)/විදේශීය උපදේශකයකු/ගුණාත්මක කළමනාකරණ විගණකවරයකු/තීරකවරයකු ලෙස) :..........................................

3.ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කිරීමේ අංකය (අදාළ වන්නේ නම්) :............................................

*අභියාචනයේ විෂය කරුණට අදාළ විස්තර :*

1. දුක්ගැනවිල්ලෙහි/අතෘප්තියෙහි ස්වභාවය (කෙටියෙන්) :..........................................................................................
   (දුක්ගැනවිල්ල විස්තර කරමින් එක් පිටුවක පමණ සම්පූර්ණ වාර්තාවක් අමුණන්න)

2. අභියාචනය ඉදිරිපත් කරනු ලබන්නේ යම් දුක්ගැනවිල්ලක්/අතෘප්තියක්/අධිකාරියේ තීරණයක් සම්බන්ධයෙන් ද එකී දුක්ගැනවිල්ල/අතෘප්තිය/අධිකාරියේ තීරණය උද්ගත වූ දිනය :........................................

3. අභියාචනය ඉදිරිපත් කරනු ලබන කාරණයට සම්බන්ධ වෙනත් තැනැත්තන් සහ ඔවුන්ගේ තත්ත්වය ..........................

4. සිදු කරන ලද ගෙවීම රුපියල් :................................. ගෙවීම සිදුකරන ලද දිනය :..............................................

5. අමුණන ලද ලේඛන පිළිබඳ ලැයිස්තුව :...............................................

දිනය :...................................

අභියාචකගේ අත්සන :.....................................
නිල මුද්‍රාව :

**දෙවන උපලේඛනය**

**අභියාචනා මණ්ඩලය වෙත අභියාචනයක් සිදු කිරීම සඳහා අවශ්‍යවන්නා වූ ගාස්තුව.**

(2 (2) වන නියෝගය)

| *අභියාචනයේ ස්වභාවය* | *ගාස්තුව (රු.)* |
|---|---|
| දේශීය ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු හෝ විදේශීය කොන්ත්‍රාත්කරුවකු විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනය | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අදාළ ලියාපදිංචි ගාස්තුවෙන් 10% |
| දේපල සංවර්ධනකරුවකු, ඉදිකිරීම් ද්‍රව්‍ය සපයන්නකු,බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ අයිතිකරුවකු, ශිල්පියකු, ඉදිකිරීම් වැඩකරුවකු, දේශීය උපදේශකයකු (සුදුසුකම්ලත් තැනැත්තකු), විදේශීය උපදේශකයකු, ගුණාත්මක කළමනාකරණ විගණකවරයකු හෝ තීරකවරයකු විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අදාළ ලියාපදිංචි ගාස්තුවෙන් 5% |

03-1068

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.